පන්හිඳයි පින්සලයි

''ජනාගෙ වැඩේ සද්දෙට ගියා නේද?'' ජනනාත් වරාගොඩගේ ''බාහු රංග'' බලලා ආව පින්සල පන්හිඳගෙන් ඇහුවා.

''නැතුව නැතුව වගේ කඳුකන්ඩලල්ල හෙල්ලෙන්න තුවර පෙරහරේ බොර හඬදෙනවා වාගේ හරියට''කවදාවත් නැතුව පන්, පින්ට එකඟ වුණා.

''මොනවා හරි ලිව්වනං හොඳා, ඒත් ඉතින් මොකුත් නොදැන මොනවා ලියන්නද?'' පන් කෙඳිරි ගෑවා.

''ඔං තිතුවා ඕක. හොඳ වෙලාවට මං රණ්ම නංගිට කිව්වු කරලා එයා අර කියෙව්ව කොල ටික එකතු කර ගන්නා.'' පින් රණ්ම කියලා කිව්වේ ප්‍රසංගයේ පූර්විකා ඉදිරිපත් කරපු රණ්ම සොයිසා තිලෙව්කාවට.
ගමේ දෙවොල් පොළක, තොව්ලියක, ගම්

උඩරට සම්ප්‍රදායේ නැටුම් අතරින් දැනට වඩාත්ම ජනප්‍රිය වී ඇති වෙස් නැටුම් ප්‍රධානයේ වූ කොහොඹ කංකාරිය හමි වූ වත් පිළිවත් කුමයෙන් අරඹුණා වූ අංගයකි. ඉතාමත්ම අලංකාර වූ වෙස් ඇඳුම ආභරණ හැට හතරකින් යුක්තය.

මඩුවක එහෙමත් නැතිනම් පෙරහරක දකින්න ලැබෙන ගැමි අංග පෙළක් ජනනාත් හාදයා පෙළෙන්වා තිබුණා. ඉතින් ඒ දේවල් දැක බලා ගන්න බැරි වුණ අටව පවා වරතා යමක් කෙරියෙන් නොනු කරන්න පන්හිඳ තිතුවා.

හෙළ නර්තන කලාවේ ප්‍රධාන සම්ප්‍රධායන් තුන වන්නේ උඩරට, පහතරට, සබරගමුව නැටුම් සම්ප්‍රදායන්ය. නර්තන විලාසය, ඉරියව්, හස්ත මුද්‍ර, මුද්‍රාණි ඉරියව්, ඇඳුම් පැළඳුම්, වාසයෙන පර මෑත නොව වාසයෙන බෙර පවා සම්ප්‍රදායන්ව අනුව එකිනෙක ඉඳුරාම වෙනස් වේ. උඩරට සම්ප්‍රදායේ නර්තනයන් සඳහා හැට බෙරයක්, පහතරට සම්ප්‍රදායේ නර්තනයන් සඳහා පහතරට බෙරය හෙවත් යක් බෙරයත්, සබරගමු සම්ප්‍රදායේ නර්තනයන් සඳහා දවුල හා තම්මැට්ටමත් ප්‍රධාන වශයෙන් යොදා ගනිති. මීට අමතරව උඩරට නැටුම් සම්ප්‍රදායේදී උඩකන්කිය සහ රබාන ද තාල වාද්‍ය භාණ්ඩ ලෙසින් හැසිරෙවී. දවුල හා තම්මැට්ටම හරවාන් වට අත් සියළු භාණ්ඩ අතිනම් වැදගැ. දවුලේ දකුණු පස කෝටුවකින් ද වම් පස අතින් ද වැයෙන අතර තම්මැට්ටම වාදකය වන්නේ වේවැලකින් තවා බැඳ සකස් කර ගන්නා ලද ''කඩිප්පු'' යුගලයෙනි. ප්‍රසංගය අරඹනු ලැබුයේ ''මල්පදය'' නම් වූ නර්තනයෙනි. රජතනුවර ප්‍රදේශයේ දක්නට ලැබෙන සබරගමු සම්ප්‍රදායේ මෙම නර්තනය පන්තිනි දේවිය වර්ණනා කිරීම සඳහා කෙරෙන්නෙනි. කිරිමඩු වත් පිළිවෙත් ගි ප්‍රධාන ඇංගයක් ද වන්නේය ''මල් පදය''.

උඩරට සම්ප්‍රදායේ නැටුම් අතරින් දැනට වඩාත්ම ජනප්‍රිය වී ඇති වෙස් නැටුම ප්‍රධානයේ වූ කොහොඹ කංකාරිය නම් වූ වත් පිළිවත් කුමයෙන් අරඹුණා වූ අංගයකි. ඉතාමත්ම අලංකාර වූ වෙස් ඇඳුම් ආභරණ හැට හතරකින් යුක්තය. එම ආභරණවලින් විරිදෙන්නා වූ ප්‍රභාව තිරුරැස් සංකේතවත් කෙරේ. වෙස් ඇඳුම අඳිමින් නර්තනයෙහි යෙදීම සඳහා පරිපූර්ණ වෙස් නැටුවලක් වීමට වසර

සිසිර දිසානායක

ජනාගේ කංකාරිය

ගණනායක ඉමහත් කැපවීමකින් යුතුව මනා පුහුණුවක යෙදිය යුතු වන්නේය. පහතරට නැටුම් සම්ප්‍රදායේ එක ''දොවොල්'' නැටුම් විවිධ දෝෂයන් පත කිරීමටත් ඇතැම් රෝග සුව කිරීමටත් යොදා ගැනෙයි. රැකුණාර ආවේශික වූ විවිධ වර්යයේ වෙස් මුහුණු බැඳ ගනිමින් කෙරෙන්නා වූ පහතරට නැටුම් ජන සමාජයේ අතැතැම් ප්‍රකට චරිත ද, මුල් බසගත් ඇඳැගිලි හා විශ්වාසයන් ගිසාවෙන් ඕනි වූ මනඃකල්පිතයන් ද මත කිරීමණය වූ කලාවක් වේ. රාක්ෂ, ගුරුවර, කතයා, ගිරිදෙවි, මහා සම්මත රජු හා රැජිත, මතමේ කුමරු හා කුමරිය, වැදි රජ, ජසයා, ලෙන්චිනා වැනි මුහුණ තිතර මෙම නර්තනයන් සහ රංගනයන් සඳහා භාවිතා වේ.

සාම්ප්‍රදායික ගැමි නැටුම් අතර වන්නම්, ලී කෙළි, කළගෙඩි නැටුම්, කුළු නැටුම් බහුලව දක්නට ලැබේ. වර්ණනාවන් කෙවන් වන්නම් නැටුම් අඩරට සම්ප්‍රදායට අනුව ප්‍රධාන වශයෙන් දහ අටකි. අසත්, අසදි, මොණර, හංස වැනි සත්ත්වයන් ගේ ඉරියව් හා

හැසිරීම් විදහාලමින් ගජහා, තුරඟා, මයුර වැනි වන්නම් නිර්මිතයි. වන්නම් හැරුණු කල අනෙකුත් බොහෝ ගැමි නැටුම්, දිවයිනේ ප්‍රධාන වශාව වූ කුඹුර නොවීනය ආදිතිව කෙරෙන්නා වූ කරපුතු පදැනම් කොටගෙන නිර්මාණය වූ ඇංගයක් වේ. එදිනෙදා ජීවිතයේ ක්‍රියාකාරකම්වල අංග වළන නර්තනයන් ලෙසින් ප්‍රතිනිර්මාණයවීම ගැමි නැටුමෙහි අතිම අපූර්වත්වයයි.

අග්නි නම් වූ ගිනි දේවතාවාණ්ට උපහාර වශයෙන් කෙරෙන නර්තනයන්ය. ''පන්දම් පාලිය'' සහ ''ගිනි සිසිලු''. ගින්න සමගින් මිනිසාට විත කරන්නා වූ යක්ෂයින් විසිහත් දෙනෙකු අභිබවා යාම සඳහා යන්තු මන්ත්‍රාදිය වෙත අතිත බලය පෙන්වීමට පහතරට සම්ප්‍රදායානුකූලව නැටුම් ඉදිරිපත් කෙරේ. මෙහිදී නර්තන ශිල්පියා දැවෙනිති අතිති ගිනි පන්දම් යුගලය වරින් වර මුව තුල හොවා ගැනීම, සිරුර පුරා ගෙන යාම, නොයෙකුත් අන්දමට අතින් අත මාරු කරමින් කැරකැවීම ප්‍රේක්ෂකයින් ලොමු දැහැගැන්වීමට සමත් වන්නේය. 'පෙළමේ'' නමින් හඳුන්වනු ලබන පහතරට සම්ප්‍රදායේ නර්තනය ඉතා රෙගවත් රිද්මයකට රාගදක්වන්නෙනි. ශිල්පියාගේ ජවය සහ නම්‍යශීලීබව මනාව පෙන්වා දෙමින් කරකැවෙමින්, පිනුම් ගසමින් ප්‍රේක්ෂකයින් අමන්දානන්දයට පත් කරවන්නකි. ''පෙළමේ'' මෙය පන්තිනි දෙවියන් වෙනුවෙන් පවත්වන දෙවොල් මඩුව වත් පිළිවෙත් ක්‍රම හා සම්බන්ධයි.

මෙකී සම්ප්‍රදායික නර්තන අංගයන සමගින් ඉදිරිපත් වූ නව නිර්මාණයන් ද ප්‍රශස්ත වෙරමක විය. ''සිව් බෙර'' නමින් හඬ ගැන්වුණ හේරි වාදය සංකල්පය විටෙක සංවාදයක් ලෙසින්ද විටෙක සමූහ වාදනයක් ලෙසින්ද ඉදිරිපත් විය. ශිල්පීන්ගේ අංගචලන, ඉරියව් සහ ඉඟිකිරීම් මෙහේදී ප්‍රේක්ෂකයා සිනා ගන්වන්නට ද හේතුවිය. හෙළ නර්තනයේදී මෙන් ම වාදනයේ දී ශිල්පීන් අතර අනෙනාන්‍යව ඉඟියෙන් කෙරෙන සංවාද ඔවුන්ගේ නර්තන හා වාදන කුසලතාවයන්ට එක් කරන්නේ ආලෝකයයිමයි. එය ඔවුන්ගේ ශිල්පත්වය තිර ලෙසින් ප්‍රේක්ෂකයාට දැනවීමක් ද වන්නේ මනා අභ්‍යාසයකින් හා ශිල්පත්වයකින් පොර ශිල්පියෙකුට තම ශිල්පයට අමතර එලෙස වේදිකාවේ හැසිරිය නොහැකි නිසාවෙනි. පහතරට සම්ප්‍රදායේ දී නම් උසුළු විසුළු වඩුන් හා ව්‍යාංගාර්ථයෙන් ගහන දෙබස් නර්තන ශිල්පියාත් හේරි වාදය ශිල්පියාත් අතර හුවමාරු වන්නේය. මෙහිදී බෙර වාදකයා ''ගුරුන්නාන්සේ'' නමින් අමතනු ලබයි. එකිනෙකාගේ අත්තල හා අත්පුස් ගසමින් ජයනාත් ශිල්පියා අනෙකුත් ශිල්පියෙකු සමගින් කළ නිර්මාණය කාගේත් සිත් ගන්නා සුළු අංගයක් විය. තමන් තුළ සැඟව ඇති රිද්මය අනෙකෙකු හා ගැලපාලමින් කළ මේ නිර්මාණය මතුපිටින් පෙනෙනා තරමට පහසු කාර්යයක් නොවේ. කෙසේ වුවද ප්‍රේක්ෂකයින් පවා තමා හා යා කරවාගන්නට සමත්වීය ජයනාත් ශිල්පියා. 'අත් පොඩි පොඩි පුවත්න.....''පින්ට පොඩි ළමයින්ගේ කවියක් මතක් වෙලා....''

මෙවන් ප්‍රසංග තුළින් දැකිය හැකි මූලිකම අංගයන වන්නේ තරුණ ජවය, සැපවීම හා දායකත්වයයි. මතු පරපුර වෙනුවෙන් මෙවන් සංස්කෘතික අංගයන් දායාද කිරීමෙහි භාරධුර කාර්යය දිවයිනෙහි මතුනොව කැන්ගරුවා දේශයේ ද කරට ගත් යොවුන් ශිල්පි ශිල්පිනීන් පසුගිය වර ලිපියෙන්ද අවධානයට ලක් වූ තාරුණ්‍යයේ ජවය, හැකියාව හා කැපවීම පිළිබඳව දිය හැකි තවත් කදිම නිදසුනක් වශයෙන් ය ජයනාත් වරාගොඩගේ ''බාහු රංග'' ප්‍රසංගය ලෙසෙය විසිසුණේ. ඒ සමගින් ම ජනනාත් රෙරට රසික ප්‍රේක්ෂකයනට හඳුන්වාදීමද අපගේ යුතුකම වන්නේය. ජනප්‍රිය හා ප්‍රවීන ගුරන්වදුළු හා වේදිකා රංග ශිල්පියෙකු වන විජේරත්න වරකාගොඩ ශිල්පියාණන්ගේ පුත්‍ර රත්නයයි. ගේ, කොළඹ ආනන්ද විද්‍යාලයේ ශිෂ්‍යයෙකුව සිටියදී විද්‍යාලයීය ශිෂ්‍ය හව හේවිසි තූර්යවාදක කණ්ඩායමේ සාමාජිකයෙකු වශයෙන් ලද පන්තරය ජනනාත් නිතැතින් සිහිපත් කරන්නේය.

අවර ගණායේ ඔහු රූප කෝළම් නොව හෙළ හැඳැයාවේ මහතු දායාදයන් ලොව හමුවේ තබන්නට ජනනාත්ගේ මේ කැපවීම පන් ලියවිල්ල හමාර කළා.

It was the Boxing Day
A day turned into apathy,
A day reminisced
The millions perished.

It was tsunami
That came in a hurry
Fuming with fury
Devouring everything
On its way standing.

Victims it did not choose,
Young or old
Good or bad
Rich or poor
Weak or stronger.
Everyone it treated alike,
Certainly we dislike.

It was the sea by the Coral Gardens
Where I swam in childhood,
Often floating as I relaxed
Enjoying the beauty of the wide expanse of water
And above, the limitless blue sky clear.

Who expected below the seabed
An earthquake,
So ferocious
With surged and swelled waves
Rushing beyond its shores
Throwing everything in ruins.

Having devoured and belly full,
It now looks placid, composed
Unruffled and relaxed.
But the Boxing Day is closing in,
Will it come again?

Uncertainty regins.

Mathu H. Liyanage
(South Australia).